# ගොවි පැණ තරඟය

## ගොවිකම් සඟරා පාඨකයින්ට කදිම අවස්ථාවක් !

මෙම කලාපයේ පලකරනු ලබන ගොවි පැන වලට පිළිතුරු ලියා, මෙම පිටුවේ ඇති ගොවි පැණ කූපනය ඔබගේ පිළිතුරු පතෙහි අලවා පහත සඳහන් ලිපිනයට එවන්න.

**කොන්දේසි**

1. ගොවිපැන කූපනය සංස්කාරක වෙත එවන සෑම පිළිතුරු පතකම අලවා තිබිය යුතුය.
2. නිවැරදි පිළිතුරු සපයනු ලබන ජයග්‍රාහකයින් පස් දෙනෙකුට ත්‍යාග පිරිනමනු ලැබේ.
3. එම ජයග්‍රාහකයින්ගේ නම් සහ ලිපින ඉදිරි කලාපයක පලකරනු ලැබේ.
4. ජයග්‍රාහකයින්ගේ තිලිණ තැපැලෙන් ලබාගැනීමට හෝ පේරාදෙණිය ගලහ හන්දියේ කෘෂිකම් ප්‍රකාශන අංශයෙන් පැමිණ ලබාගැනීමට සැලසිය හැකිවේ.
5. එක් තරඟකරුවකුට කූපන් සහිත පිළිතුරු පත් කිහිපයක් ඉදිරිපත් කළ හැකිය.
6. සංස්කාරක මණ්ඩලයේ තීරණය අවසාන තීරනය වනු ඇත.
7. කෘෂිකම් දෙපාර්තමේන්තුවේ සේවකයින්ට හෝ ඒ අයගේ යැපෙන්නන්ට මෙම තරඟයට ඉදිරිපත් විය නොහැකිය..
8. 1999 ජනවාරි මස 31 දිනට පෙර එවන පිළිතුරු පමණක් භාර ගනු ලැබේ.

**පහත සඳහන් ප්‍රශ්ණ වලට සපයා ඇති පිළිතුරු අතරින් නොගැලපෙන පිළිතුර සඳහන් කොට එවන්න.**

1. බෝග වලට රසායනික පොහොර යෙදීමෙන්

    (අ) ක්ෂුද්‍ර ජීවීන්ටද පෝෂ්‍ය පදාර්ථ ලබා ගත හැකි වේ.

    (ආ) ශාක වලට අවශ්‍ය පෝෂක ලැබේ.

    (ඇ) ශාක පටක මෘදු වේ.

    (ඈ) පාංශු ව්‍යුහය දියුණු වේ.

2. බෝග

    (අ) N.P.K. රසායනික පොහොර වලින් පමණක් සාර්ථකව වැඩේ.

    (ආ) කාබනික පොහොර වලින් පමණක් සාර්ථකව වැඩේ.

    (ඇ) පොහොර නොමැතිව වැඩේ.

    (ඈ) රසායනික හා කාබනික පොහොර මිශ්‍ර කොට යෙදීමෙන් සාර්ථකව වැඩේ.

3. කොම්පෝස්ට් පොහොර සෑදීමේදී

(අ) ගව මූත්‍රා කලවම් කිරීමෙන් දිරාපත් වීම ඉක්මන් වේ.

(ආ) ගිලිරිසිඩියා කොළ භාවිතා කිරීමෙන් දිරාපත්වීම ප්‍රමාද වේ.

(ඇ) තෙතමනය පවත්වා ගැනීමෙන් දිරාපත් වීම ප්‍රමාද වේ.

(ඈ) වැසි ජලය එකතු වීමෙන් පෝෂ පදාර්ථ සේදී යයි.




ලිපිනය:


ප්‍රධාන සංස්කාරක
ගොවිකම් සහරාව
තැ.පෙ.18. පේරාදෙණිය.


# පණුවන්ගෙන් වන සේවය

පණුවන් විසින් වසරක් තුළ ආහාරයට ගෙන පිට කරනු ලබන පණු පස් ප්‍රමාණය අක්කරයකට වියලි පස් ටොන් 15 ක් පමණ වේ. මෙයට තෙතමනය අඩංගු වූ විට කොපමණ වේ දැයි සිතා බලන්න. මේ අනුව පණුවන්ගේ ආහාරයට අවශ්‍යවන කාබනික ද්‍රව්‍ය යොදමින් පස හොඳින් නඩත්තු කළ හොත් වසර 10 ක් තුළදී ඔවුන් කොපමණ පස් ප්‍රමාණයක් පෙරලන්නේ දැයි ගණනය කර බලන්න. මෙයට හොඳම උදාහරණය නිවසේ කසල ගෙන ගොස් දමන ස්ථානයේ පස් තට්ටුවය. එහි විශාල පණු ගහනයක් සිටින අතර පස ඉතා සාරවත් වේ. පණුවන් අධික ස්ථානවල බීම් කෙටීමකින් තොරව බීජ හා ශාක රෝපණය කලද ඒවා ඉතා හොඳින් වැඩේ. පණුවන්ගේ ආහාර පද්ධතිය හරහා පස ගමන්කරද්දී එමගින් නිකුත් කරනු ලබන එන්සයිමවල ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන පසේ අඩංගු කාබනික කොටස් හා පස් හා පාෂාණමය කොටස් තවදුරටත් සියුම් ලෙස ජීර්ණය වී ඒවායේ අඩංගුව ඇති පෝෂක කොටස් ශාකවලට අවශෝෂණය වීමට පහසු තත්වයට පරිවර්තනය වේ. පණු පස් ඉතා සියුම් ලෙස කළ යුතු මැටි කර්මාන්තය සඳහා යෝග්‍ය වේ. පණුවන්ගේ ජීර්ණ ක්‍රියාවලිය නිසා පසේ ජෛවන්‍ද්‍රිය කොලොයිඩය දියුණු වේ. ජෛවන්‍ද්‍රිය කොලොයිඩය යනු පාංශු කොලොයිඩය හා සමානව ක්‍රියා කරනු ලබන ඉතා සියුම් කොටස් වේ. ඒවා මොලිකියුල වලට වඩා විශාල වේ. නිරතුරුව සෘණ ආරෝපණයකින් යුක්ත වන බැවින් $H^+ Mg^+, Ca^+, K^+, Fe^+, Zn^+$ ආදී ධන ආරෝපිත අයන ආකර්ශනය කරගනු ලබයි. මේ නිසා පසේ හුවමාරු කරගත හැකි කැටයන ප්‍රමාණය (කැටයන හුවමාරු ධාරිතාව) වැඩි වේ. ශාක වලට ලබාගත හැකි ප්‍රොස්පරස්ද (P) සහ චූණ්ණ (Ca) ප්‍රමාණයද වැඩි වේ. පාංශු කොලොයිඩයට වඩා ජෛවන්‍ද්‍රිය කොලොයිඩයේ සෘණ ආරෝපණය බෙහෙවින් වැඩිය. පණුවන් නිසා පසේ වාතනය, ජල වහනය හා ජලය රඳවා තබා ගැනීමේ හැකියාව වැඩිවේ. යට පස මතුපිටට ගෙන එන නිසා කලින් දිය වී කාන්දු වී ගිය පැළෑටි පෝෂක වලින් කොටසක් නැවත පස මතුපිටට ගෙන එනු ලැබීමෙන් ඒවා ශාක වලට ලැබේ. පසේ සවිකරණය වඩිනය වේ.

මිනිසාගේ බලපෑමට යට නොවූ වනාන්තරයේ පණුවන් රාශියක් සිටිති. වනාන්තර පසේ කාබනික ද්‍රව්‍ය ගහන වේ. තෙතමනය ආරක්ෂාවී ඇත. සෙවන සහිත බැවින් පණුවන්ගේ ජීවත්වීමට හිතකර වේ. මේ තත්වය යටතේ පණුවන් ඉහත ඡේදයේ සඳහන් පරිදි සේවය කරමින් වනයේ පැවැත්මට මහෝපකාරී වේ. අපගේ ක්ෂේත්‍රවලටද පණුවන්ගේ සේවය ලබා ගැනීමට නම් වනාන්තරයේ තත්වය ක්ෂේත්‍රයේද සැලසිය යුතුය.

පසට ජෛවන්‍ද්‍රිය ද්‍රව්‍ය එකතු කිරීම, වසුන් යෙදීම, ජල සම්පාදනය ආදිය මැනවින් පවත්වා ගත යුතුය. පසට වසුන් යෙදීමෙන් පාංශු උෂ්ණත්වය පාලනය කරගත හැකි වේ. පසේ ජීවත්වන පණුවන්ගේ ගහනය පසට යොදනු ලබන ජෛවන්‍ද්‍රිය ද්‍රව්‍ය ප්‍රමාණයට සෘජු සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. ජෛවන්‍ද්‍රිය ද්‍රව්‍ය අඩංගු අක්කරයක භූමියක පණුවන් 250000 සිට 1000000 ක් අතර ජීවත්වනු ඇතැයි ගණන් බලා ඇත. එක් පණුවෙකු ග්‍රෑම් 1/2 සිට 1 දක්වා බරනම් අක්කරයක සිටින පණුවන්ගේ බර හා ඔවුන් මිය යෑමෙන් පසු පසට එකතුවන ජෛවන්‍ද්‍රිය කොටස් ප්‍රමාණයද සැලකිය යුතු වේ.